පාරිභෝගික පැමිණිලි සඳහා ලබා ගත හැකි සහන හා පිළියම්

- භාණ්ඩය මාරු කර ගැනීම
- මුදල් ආපසු ලබා ගැනීම.

සිහිබුද්ධිමත් පාරිභෝගිකයකු ලෙස ඔබ

විශ්වාසවන්ත වෙළෙඳසැල්වලින් භාණ්ඩ මිල දී ගන්න.

සෑම මිලදී ගැනීමකදීම රිසිට් පතක් ඉල්ලා සිටීමට අමතක නොකරන්න.

බුද්ධිමත් පාරිභෝගිකයකු ලෙස වෙළෙඳපොළ තුළ හැසිරෙන්න.

මිල දී ගැනීමට ප්‍රථම සැලසුම් කරන්න.

අනවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමෙන් වළකින්න.

ඔබත් කිසියම් අසාධාරණයකට ලක් වූවා ද? එසේ නම්

- භාණ්ඩය හෝ සේවාව මිල දී ගත් ආයතනය වෙත යන්න.
- මුහුණපෑමට සිදු වී ඇති ගැටලුව පැහැදිලිව සාකච්ඡා කරන්න.
- අදාළ වෙළෙඳ ආයතනය සමග ඔබේ ගැටලුව සඳහා සාධාරණ සහනයක් ලබා ගන්න.

ඉහත ක්‍රියාමාර්ග මඟින්
ඔබට සහනයක් නොලැබුණේ නම්,

අපට ලියන්න

අධ්‍යක්ෂ (මෙහෙයුම්),
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
1 සහ 2 වන මහල,
සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
අංක 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

ක්ෂණික ඇමතුමක් දී අපට කියන්න
1977

අපගේ පැමිණිලි අංශයට කියන්න
0117755481-3

අපගේ වෙබ් අඩවියට යොමු කරන්න
www.caa.gov.lk

අපගේ ෆේස්බුක් පිටුවට යොමු කරන්න
www.facebook.com/Consumer Affairs Authority

ඔබගේ රහස්‍යභාවය අපි නිබඳ ආරක්ෂා කරන්නෙමු.

පාරිභෝගික ඔබගේ ආරක්ෂාව
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වගකීමයි.

අපගේ දැක්ම

"සදාචාරාත්මක
ව්‍යාපාරික පරිසරයක් තුළ
සුරක්ෂිත වූ පාරිභෝගිකයෙක්"

අපගේ මෙහෙවර

"පාරිභෝගික සවිබල ගැන්වීම
වෙළෙඳපොළ විධිමත් කිරීම සහ
තරඟකාරිත්ව ප්‍රවර්ධනය තුළින්
පාරිභෝගික අයිතීන්
සුරක්ෂිත කිරීම"

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
1 සහ 2 මහල, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
අංක 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
දුරකථන - 0117755481-3 ෆැක්ස් - [illegible]
[illegible] www.caa.gov.lk Consumer Affairs Authority
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

පාරිභෝගික ඔබේ අයිතිවාසිකම්

සෞඛ්‍යයට හා ජන ජීවිතයට හානිකර භාණ්ඩ හා සේවාවන්ගෙන් ආරක්ෂා වීමට ඇති අයිතිය.

නිවැරදි තෝරා ගැනීමක් සඳහා ඔබ සොයන තොරතුරු විශ්වසනීය සහ ලබා ගැනීමට ඇති අයිතිය.

ගුණාත්මක බවින් යුත් භාණ්ඩ හා සේවා තෝරා ගැනීමට ඇති අයිතිය.

පාරිභෝගිකයාට අදාළවන නීති/ ප්‍රතිපත්ති සකස්කිරීමේදී පාරිභෝගික ඔබගේ ද අදහස් දැක්වීමට ඇති අයිතිය.

ගුණාත්මක බවින් තොර භාණ්ඩ හා සේවාවන් නිසා සිදු වන හානියට අදාළ ආයතනවලට එරෙහිව වන්දි හෝ සහන ලබා ගැනීමට ඇති අයිතිය.

බුද්ධිමත් ලෙස වෙළෙඳපොළ තුළ හැසිරීමට අවශ්‍ය දැනුම ලබා ගැනීමට ඇති අයිතිය.

මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය. (ආහාර, නිවාස, ඇඳුම්, සෞඛ්‍යය, සනීපාරක්ෂක සේවා, අධ්‍යාපනය, රැකියාව)

සුරක්ෂිත පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රධාන අරමුණු

පාරිභෝගිකයන්ගේ ජීවිත සහ දේපලවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවි කිරීම සහ සේවා සැපයීමට එරෙහිව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.

අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම්වලට හිමි සැලකිල්ල දැක්වීමට සහතික වීම.

හැකි සෑම විටම පාරිභෝගිකයාට, තරඟකාරී මිලට භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීම.

වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන පාරිභෝගිකයන් සූරාකෑමට ලක්වන ආකාරයේ කටයුතුවලට එරෙහිව පාරිභෝගිකයාට සහන ලබාදීම.

ඔබ දැනුවත් විය යුතු ඔබේ ආරක්ෂාව සඳහා ම වන නීති රීති වලින් කිහිපයක්

භාණ්ඩ විකිණීමේ දී මිල ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ.

භාණ්ඩයේ සටහන් මිලට වඩා වැඩි මිලකට විකිණීම වරදකි.

වෙළෙන්දන් විසින් භාණ්ඩවල ඇසුරුමෙහි සඳහන් තොරතුරු වෙනස් කිරීම, මකා දැමීම, විකෘති කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

භාණ්ඩ විකිණීමේදී මුදල් ගෙවීම හැර වෙනත් කිසිම කොන්දේසියකට යටත්ව භාණ්ඩ විකිණීම නොකළ යුතුය.

මිල දී ගන්නා භාණ්ඩ සඳහා මුද්‍රිත ලදුපතක් හෝ බිලපතක් සඳහා ඉල්ලීම් කළ හැකි ය.

පාරිභෝගිකයාට අවශ්‍ය නම් භාණ්ඩ මිල දී ගැනීමට පෙර හෝ පසුව එම භාණ්ඩය [illegible] ප්‍රමාණවත් [illegible] වෙළෙඳසැලේදී [illegible] යුතු ය.

පාරිභෝගිකයාට මිල දී ගන්නා භාණ්ඩ සඳහා සවිස්තරාත්මක බිලපත් ලබා දීම අනිවාර්ය වේ.

ඔබ මිල දී ගන්නා භාණ්ඩය යම් කාර්යයක් සඳහා නිර්දේශිත කරන ලද්දක් ද, එම භාණ්ඩය අදාළ කාර්යය සඳහා සාධාරණ ලෙස යෝග්‍ය විය යුතු ය.

අධිකාරිය විසින් නිශ්චය කරන ලද භාණ්ඩ සඳහා උපරිම මිලක් නියම කර ඇති අතර එම නියමිත මිලට වඩා වැඩි මිලකට විකිණීම වරදකි.

ඇසුරුම් කරන ලද භාණ්ඩයන්හි මිල, භාණ්ඩ අංකය, නිෂ්පාදිත දිනය, කල් ඉකුත් වීමේ දිනය හා බර හෝ පරිමාව සඳහන් කිරීම අනිවාර්ය වේ.

ඉලෙක්ට්‍රොනික භාණ්ඩ සේවා සපයන ආයතනයන්ගින් විස්තරාත්මක බිලපත් නිකුත් කිරීම අනිවාර්ය වන අතර (විකුණුම් දිනය, [illegible], [illegible] ආදිය)

ඇසුරුම් කළ ඖෂධවල මිල, භාණ්ඩ අංකය, නිෂ්පාදිත දිනය, කල් ඉකුත් වීමේ දිනය, නිෂ්පාදකයාගේ/ආනයනකරුගේ විස්තර ඇසුරුමෙහි සඳහන් කළ යුතුය.

අධිකාරිය විසින් ප්‍රමිතිය අනිවාර්ය කරන ලද භාණ්ඩ විකිණීමට ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලාංඡනය (SLS) ඇසුරුමෙහි සඳහන් කළ යුතුය.

[illegible] අවශ්‍ය වන බර ප්‍රමාණය, නිශ්චිත ඇසුරුමේ මිල ඇති ලේබලයේ සඳහන් කළ යුතුය.

විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් උපකරණ/උපාංග විකිණීමේ දී අවම වශයෙන් මාස 06 ක වගකීම් කාලයක් ලබා දිය යුතුය.

පාරිභෝගික ඔබගේ ආරක්ෂාව
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වගකීමයි.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
අංක 27, 1 සහ 2 මහල,
සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02
දුරකථන අංක 0117755481-3 ෆැක්ස් [illegible]
[illegible] www.caa.gov.lk Consumer Affairs Authority
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය